(c) www.sinhalalyrics.com

සාරි පොඩ්ඩක් ඇඳගෙන
මාල පොඩ්ඩක් බැඳගෙන
දීග පොඩ්ඩක් යන්නට කතා කරාවී
කතා කරලා මංගල්ලේ නියම කරාවී

රණ්ඩු කරලා සින්දු කියලා
තොරන් බැඳලා රැහැන් ඇදලා
පාවාඩ පිට මනාලයා ගෙදරට එවී
ගෙදර ඇවිත් ලැජ්ජාවෙන් මුකුළු කරාවී

තක්කිට තරිකිට කියලා
තිරික්කලේ අපි යනකොට
අහළ පහළ ඉන්න ඇයෝ බලා ඉඳීවි
බලා ඉඳලා අපි දෙන්නට විහිලු කරාවී

එතනො සුමනො නාඩා ඉඳින්
සිකුරු තරුව පායනකන්
ඔයාලටත් පිරිමි කෙනෙක් බැල්ම හෙලාවී
බැල්ම හෙලලා තවත් ගමක් එළිය කරාවී

පද රචනය - සුනිල් ආරියරත්න
සංගතනය - නන්දා මාලිනී